## සමාජයීය වගකීම් හැඳින්වීම.

මුල් කාලයේ දී එනම් 21 සියවසට පෙර ව්‍යාපාර සැලකිල්ල දැක්වූවේ තම අයිතිකරුවන්ට ලාභ ලබාදීම කෙරෙහිය. එහෙත් 21 වැනි සියවසේ ආරම්භයේ දී අයිතිකරුවන්ට ලාභ ඉපයීම යන සංකල්පයෙන් බැහැරව ව්‍යාපාර කෙරෙහි උනනන්දුවක් දක්වන අනෙකුත් පාර්ශව වලටද ප්‍රතිලාභ ලබාදිය යුතුය යන සංකල්පය සමාජයේ ස්ථාපිත විය.

තවද කාර්මීකරණය, නව තාක්ෂණය වර්ධනය ,විද්‍යුත් ව්‍යාපාර, ගෝලීයකරණය, බහු ජාතික සමාගම් බිහිවීමත් ඒවායේ ක්‍රියාකාරිත්වය ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශව මෙන්ම පොදුවේ සමාජයට අහිතකර ලෙස බලපෑම් කිරීමත් නිසා සමාජය තුළින්ම ව්‍යාපාර වල සමාජ වගකීම පිළිබඳ අවශ්‍යතාව හා වැදගත්කම මතුවන්නට විය.

ව්‍යාපාර හා සම්බන්ධ සියලුම උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට උපරිම අයුරින් සාධාරණයක් ඉටු වන ආකාරයට කටයුතු කිරීම සමාජයීය වගකීම වේ.

ව්‍යාපාරයක සමාජ වගකීම් සංකල්පය පිළිබඳ විවිධ නිර්වචන ඉදිරිපත් වී ඇත.

**"සමස්ත සමාජයේ සහ ප්‍රදේශයේ ජනතාවගේත්, සේවකයින්ගේ හා ඔවුන්ගේ පවුල්වලත් ජීවන තත්ත්වය නංවාලීමට සහ රටේ ආර්ථික සංවර්ධනයට දායක වන බවට හා සදාචාරාත්මකව හැසිරෙන බවට ව්‍යාපාරවල අඛණ්ඩ කැපවීම ව්‍යාපාරයන්හි සමාජයීය වගකීමයි."**

World business council for sustainable development

**"සමාජය තුළ ධනාත්මක බලපෑමක් ජනිත කිරීමට ව්‍යාපාර ක්‍රියාවලිය කළමනාකරණය කරන්නේ කෙසේද? යන්න පිළිබඳ වූ අදහසකි, සමාජයීය වගකීම ."**

Mallon Baker

**"ගනුදෙනුකරුවන්, සේවකයින්, සමාජය, රජය හා පරිසරය ආදී සියලු ම උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට සාධාරණ ලෙස කටයුතු කරමින් කොටස් හිමියන්ට උපරිම අගයක් බිහි කර දීම සමාජයීය වගකීම වේ."**

Narayan Murthy





Copyright © www.e-thaksalawa.moe.gov.lk

**පුනරීක්ෂණ**

2.1

1. ව්‍යාපාර සමාජ වගකීම යන සංකල්පය පැහැදිළි කරන්න.
2. ව්‍යාපාර වලින් සමාජ වගකීම් ඉටුවිය යුතු ප්‍රධන පාර්ශවයන් නම් කර එම එක් එක් පාර්ශවය වෙත ව්‍යාපාර විසින් ඉටුවිය යුතු වගකීම් දෙකක් බැගින් දක්වන්න.
3. සමාජ වගකීම ඉටු කිරීමෙන් ව්‍යාපාරියෙකුට අත්වන ප්‍රතිලාභ හතරක් දක්වන්න.
4. සමාජ වගකීම ඉටුකරන බව පෙන්නුම් කිරීමට යොදා ගන්නා උපාය මාර්ග හතරක් දක්වන්න.
5. අද පවතින ව්‍යවසන හමුවේ බොහෝ ව්‍යාපාර සමාජ වගකීම් ඉටු කිරීමට පෙළඹෙනු දක්නට ලැබේ. සමාජ වගකීම් ඉටු කිරීමෙන් ව්‍යාපාරයකට ලැබෙන ඍජු ප්‍රතිලාභ වන්නේ.
    - මනා මානව සම්පත් කළමනාකරණයක් සිදුවීම.
    - ව්‍යාපාර තුළ විෂමාචාර පිටු දැකීමට හැකිවීම.
    - ව්‍යාපාරයේ ප්‍රතිරූපය තහවුරු වීම.
    - ආයතනය තුළ සේවක පක්ෂග්‍රාහි බව නොමැති වීම.
    - ව්‍යාපාර තුළ මූල්‍ය අක්‍රමිකතා පහව යාම.

2.2

- තිරසර ආර්ථික සංවර්ධනය යනු කුමක්දැයි හඳුන්වා එය ගොඩනැගී ඇති කුලුණු 3 දක්වන්න.
- වර්තමානයේ දී ලෝකයේ ඇති වී තිබෙන විවිධ අර්බුද හමුවේ පරිසර තිරසර ආරක්ෂණය කෙරෙහි වඩා වැඩි අවධානයක් යොමු වී ඇති බව දැකිය හැක.පරිසර තිරසර ආරක්ෂණය උදෙසා ව්‍යාපාර වලට හා පාසල් ශිෂ්‍යයෙකු ලෙස ඔබට දායක විය හැක්කේ කෙසේදැයි කරුණු දෙක බැගින් දක්වන්න.

2.3

- ව්‍යාපාර ආචාර ධර්ම පද්ධතියක් ගොඩනැගීමේදී සැලකිලිමත් විය යුතු සාධක හතරක් දක්වන්න.
- ඔබගේ පන්ති කාමරය සඳහා ආචාර ධර්ම සංග්‍රහයක් සකස් කරන්නේ නම් එහි ඇතුළත් කරන කරුණු හයක් දක්වන්න.



Copyright © www.e-thaksalawa.moe.gov.lk